**ශීර්ෂය 208 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 03 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජූලි 30 දින සේවය හැර ගිය සේවකයෙකුගේ 2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ ණය ශේෂය රු.50,741 ක් ස්ථාන මාරු වී ගිය සේවක ණය ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. | ප්‍රමාද දෝෂයකින් මෙය සටහන් වී ඇත. | සැසඳුම් ප්‍රකාශය තුළ නිවැරදි වර්ගීකරණය කර හිඟ ණය ශේෂ සටහන් කළ යුතුවීම. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ සිදුකල තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන ඉඩම් හා ගොඩනැගිලි පිළිවෙලින් රු.10,000,000,000 ක් සහ රු.800,000,000 ක් ලෙස පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. මෙම දේපලවල පිරිවැය තක්සේරු කර වසර 07 කට වැඩි කාලයක් ගතවී තිබුණද, එම වත්කම් ප්‍රත්‍යාගනනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් විමසා තක්සේරු කිරීමට කටයුතු කරමි. | දේපළ තක්සේරු වටිනාකම් පැරණි බැවින් යාවත්කාලීන කළයුතුවීම |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| **(i) ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදී ඇත. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුවීම. |

**(ii)** **ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | සකස් කිරීමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. |

**(iii)** **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | සකස් කරමින් පවතී. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුවීම. |

**(iv)** **ණයගැති සහ ණයහිමි ලේඛනය**

| | | |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දින සහ අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඇතුළත් මාර්ගෝපදේශ අංක 04 ප්‍රකාරව ණයගැති හා ණයහිමි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | පෙන්වා දී ඇති පරිදි සකස් කිරීමට උපදෙස් දී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවීම. |

**(ඇ)** **විගණන සාක්ෂි නොවීම**
**---------------------------**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | දෙපාර්තමේන්තුව විසින් රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් භාවිතා කර , 2016 දෙසැම්බර් 31 දින එකතුව රු. 1,856,987 ක් වටිනා චෙක්පතක් පෞද්ගලික ආයතනයක් වෙත නිකුත්කර තිබුණි. මෙම චෙක්පත නිකුත් කර මාස 14 ක දිගු කාල ප්‍රමාදයකට පසුව 2018 මාර්තු 02 දින චෙක්පත උපලබ්ධි වී තිබුණි. චෙක්පත දිගුකාල ප්‍රමාදයකට පසුව උපලබ්ධි වීම පිළිබදව පරීක්ෂාව සඳහා අවශ්‍ය ලිඛිත පැහැදිලි කිරීම් කිසිවක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | අදහස් දක්වා නොතිබුණි. | විගණනය විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ටෝනර්, ෆැක්ස් රෝල් සහ ප්‍රින්ටර් මාස්ටරෝල් ඇතුළු භාණ්ඩ වර්ග 04 ක තොගයක් භාවිතයට ගැනිමකින් තොරව ගබඩා කර පැවති අතර, එම තොග මිලදීගත් දින සහ වටිනාකම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | භාවිතයට ගැනීමට උපදෙස් දී ඇත. | තොග කළමනාකරණයට අදාළ තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

**(ඉ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති එලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

(ඊ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ක්‍රියාකාරී සැලැස්ම තුළට අන්තර්ගත විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත් කර නොතිබුණි | 2021 සැලැස්ම නිවැරදිව 2/2020 චක්‍රලේඛය අනුව සකස් කර ඇත. | 2020 ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛ උපදෙස් අනුව සකස් කළ යුතුවීම. |

(උ) **අවිධිමත් ගනුදෙනු**

**----------------------**

**අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31 දින දක්වා වර්ෂ 10 ක කාල සීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එහි නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව, එම බදු කාල සීමාව වර්ෂ 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමටද මණ්ඩලය කටයුතු කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2020 | ආයතනය දීර්ඝව කරුණු පැහැදිලි කර ඇත. මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බව සඳහන්ව ඇත. | ගොඩනැගිල්ලට අදාළ අයවිය යුතු කුළී අයකර ගැනීමටත්, ගොඩනැගිල්ල ආරක්ෂා කර විධිමත් ඵලදායී කාර්යයක යෙදවීමටත් ක්‍රියා කළ යුතුවීම. |

දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අය විය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම රු.66,194,051 ක් විය. මෙම හිඟ ආදායම් අය කර ගැනීමටත් දෙපාර්තමේන්තුව සතු වත්කම් කළමනාකරණය කර ආරක්ෂා කර ගැනීමටත් සහ මෙම අවිධිමත් ගණුදෙනුව නිරවුල් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්ථන වැය විෂයයන් 01 ක සංශෝධිත ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 78 ක ඉතිරි කිරීම් කර තිබුණි. | 2020 නොවැම්බර් සංශෝධිත ඇස්තමේන්තුවේදී රු.මිලියන 06 ක් ලබාදී තිබුණි. මසක් වැනි කාලයක් තුළ එම ප්‍රතිපාදන වැය කළ නොහැකි විය. | ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය කර අදාළ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මූලධන වැඩසටහන් 02 ක් සඳහා සලසාගෙන තිබූ මූලධන ප්‍රතිපාදන වලින් පිළිවෙලින් සියයට 42 ක් සහ සියයට 32 ක් වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. | මූලික වැඩ කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මඟින් ඉටු කර ගැනීමට නොහැකි වූ නිසා මෙම ප්‍රතිපාදන වියදම් කර ගැනීමට නොහැකි විය. | ලබාගත් ප්‍රතිපාදන අදාළ ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට උපයෝජනය කළයුතුවීම.. |

**2.2. බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ට වැඩි එකතු වටිනාකම රු.354,314 ක් වූ චෙක්පත් 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත්වල දින දීර්ඝ කර ගන්නා ලෙස උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීමේදී සමස්ථ පිරිවැය ඒ ඒ කාර්යයන් සඳහා බෙදා වෙන් කර නොතිබීමත්, ඉලක්ක මත ලඟාවීම මැන බැලීමට දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීමත්, කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දැක්වෙන සමුච්චිත කාර්යය සාධන වාර්තා ඉදිරිපත් නොකිරීමත් හේතුවෙන් සැලසුම් ඉටු කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පිළිතුරු ලබාදී නැත.. | ප්‍රගතිය පරීක්ෂා කළ හැකි වන පරිදි සැලසුම් සහ කාර්යසාධන වාර්තාව සකස් කළ යුතු වීම. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල ජල ටැංකිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බදු රහිත ඇස්තමේන්තුගත වටිනාකම රු.18,676,148 ක් විය.මෙම ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් 26 දින ගිවිසුමට එළඹී තිබු අතර, 2016 | පිළිගනිමි. | ප්‍රමාද වූ ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 26 දින වැඩ නිමකළ යුතුව තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබූ මෙම ඉදිකිරීම්වල ප්‍රගතිය 2020 වර්ෂය අවසානය වන විටත් සියයට 40 ක් විය. | | |
| (ආ) හම්බන්තොට මාගම් රුහුණුපුර උරුම කෞතුකාගාරයේ ශ්‍රවණාගාරය සහිත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.22,509,349 ක්වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් 2015 නොවැම්බර් 30 දින ගිවිසුමකට එළඹී තිබුණි.2016 අප්‍රේල් 30 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 18.09 ක ගෙවීම් සිදුකර තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමාද වූ ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණ සහ අළුත්වැඩියා කිරීම් සඳහා එකතුව රු.97,259,127 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත 2019 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. 2020 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන 2020 මැයි 01 දින වැඩ නිම කිරීමට නියමිතව තිබූ මෙම කාර්යය සඳහා 2020 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝ කරගෙන තිබුණි. මෙම කාර්යය සඳහා 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.30,001,964 ක් (වැට් සහිත) ගෙවීම් කර තිබූ නමුත්, 2021 මාර්තු වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු නිමකර නොතිබුණි. | පිළිගනිමි. | ප්‍රමාද වූ ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඈ) ජාතික කෞතුකාගාරයේ සත්ත්ව විද්‍යා අංශයේ උරග උභයජීවී හා මත්ස්‍ය මැදිරිය නවීකරණය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව, සඳහා එකතුව රු.3,321,300 ක් පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත 2019 ඔක්තෝබර් 01 දින පිරිනමා තිබුණි. 2020 දෙසැම්බර් 15 දින දක්වා දින දීර්ඝ කර තිබූ මෙම නවීකරණ කටයුතු වලට අදාළ කොන්ත්‍රාත්තු 2021 මාර්තු වනවිටත් නිමකළ බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී. | මේ වන විට කාර්යය අවසන් කරමින් පවතී. | ප්‍රමාද වූ ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතනයක් විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව ඊට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරි සැලසුම් සකස් කිරිමේදී කටයුතු කිරීමට සටහන් කර ගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටුවා ඇති හෙක්ටයාර් 4.6317 ක ඉඩම සහ අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර 07 ක් පිහිටුවා තිබූ ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට විවිධ රාජ්‍ය ආයතන සමඟ ලිපි හුවමාරු කරගෙන තිබුණද, 2021 මාර්තු වන විටත් එම ඉඩම් පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු දී නැත | දෙපාර්තමේන්තුව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ii) | දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර තුළ ප්‍රදර්ශනය සඳහා පවතින කෞතුක භාණ්ඩ භෞතික සමීක්ෂණයක් සිදු කර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම භාණ්ඩ 2018 වර්ෂයෙන් පසුව සමීක්ෂණය කර එම අවසන් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 දී සමීක්ෂණයන් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | ප්‍රදර්ශන භාණ්ඩ සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කළ යුතුවීම. |

**3.5. පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 මාර්තු 17 දින සිදු වූ කෞතුක භාණ්ඩ නැතිවීම සම්බන්ධව සකස් කරන ලද ඇස්තමේන්තුවක් අනුව එම භාණ්ඩ වල වටිනාකම රුපියල් ලක්ෂ 48 ක් පමණ විය. නඩු කටයුතු අවසන් නොවීම නිසා මෙම කෞතුක භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර, ඒ අනුව අස්ථානගත වූ භාණ්ඩ සහ සොයාගත් භාණ්ඩ අතර, භාණ්ඩ ඌනතාවය සහ එහි වටිනාකම් හඳුනා ගැනීමට සහ අවශ්‍ය ගැළපීම් සිදු කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක්ද සිදු කර නොතිබුණි. | පිළිතුරු දී නැත. | මෙම කෞතුක භාණ්ඩ ආරක්ෂා කිරීම, ඒවා නැවත ලබා ගැනීම සහ අඩුවී ඇති භාණ්ඩ පිළිබඳව මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවීම. |

**3.6. කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල රු.1,131,500 ක් විය. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 1 (ඉ) ඡේදය ප්‍රකාරව කල් ඉකුත් වූ ණය අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය ශේෂ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අයකර ගැනීමට ක්‍රියා කළ යුතුවීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු වර්ග 47 කට අදාළව පුරප්පාඩු 137 ක් වූ අතර, ඒ අනුව අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව අතර සියයට 29 ක සේවක ඌනතාවයක් පැවතුණි. මෙම සේවක ඌනතාවය සම්පූර්ණ කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | සේවක ඌනතාවයන් සම්පූර්ණ කර ආයතනයේ අරමුණු කරා මෙහෙයවීමට කටයුතු කළ යුතුවීම. |